*2017 මාර්තු මස 28 අඟහරුවාදා දින*
*2017 மார்ச் மாதம் 28 ஆம் திகதி செவ்வாய்க்கிழமை* ***Tuesday***
***28th March 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.00 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.00 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.00 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම අමාත්‍යතුමන්ලා, සභානායකතුමා ප්‍රමුඛ මේ අවස්ථාවට සහභාගී වෙලා සිටින ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සියළුම ගරු මැති ඇමතිතුමන්ලාගෙන් අවසරයි. අද දිනට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන්ම තිබෙන්නේ,

**අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම් :** නැත

**ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ :** නැත

**ගරු සභාපතිතුමාගේ නිවේදන :** නැත

**නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :**

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.
ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.
ගරු නියෝජ්‍ය සභාපති උදයකාන්ත ගුණතිලක මැතිතුමා.
ගරු මන්ත්‍රී නිමල් විජේනායක මැතිතුමා.
ගරු මන්ත්‍රී නිලන්ත ජයසිංහ මැතිතුමා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

නම් ඉදිරිපත් කළ සියළුම ගරු මැති ඇමතිතුමන්ලා හට සභාවේ නිවාඩු අනුමත වෙනවා.

**ලිපි ලේඛණ පිළිගැන්වීම :** නැත

**කාරක සභා වාර්තා පිළිගැන්වීම :** නැත

**පෙත්සම් :** නැත

**ප්‍රශ්න :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/03 දරණ ප්‍රශ්නය එතුමා ඉදිරිපත් කරලා තියනවා. මේ සඳහා පිළිතුරු ලැබී තිබෙනවා. එම පිළිතුරු අපි ලැබෙන්න සළස්වනවා.

ඒ වගේම ප්‍රශ්න අංක 02 යටතෙත් ගරු ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා විසින් 6/1/2017/04 දරණ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් පිළිතුරු ලැබී තියනවා. ඒ දෙකම ගරු විපක්ෂනායකතුමා වෙත ලැබෙන්න අපි සළස්වනවා.

**අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත**

**පෞද්ගලික ප්‍රකාශ කිරීම් :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

---

මේ යටතේ ගරු සිරිල් පල්ලෙපොල මැතිතුමා.

*ගරු මන්ත්‍රී සිරිල් පල්ලෙපොල*
*கௌரவ சிரில் பல்லேபொல*
*Hon.Member Cyril Pallepola*

---

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමනි, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුනි, මට පෞද්ගලිකව සිදුවූ සිදුවීමක් පිළිබඳව සිහිපත් කරන්න මම කථා කරන්නේ ගරු සභාපතිතුමනි. මම ගියා අල්ගම, කන්දෙගම පාරේ අවමඟුල් උත්සවයකට යනකොට ලංකාවේ පළවෙනි දිසාපතිතුමිය වන අපේ ගුණතිලක මැතිණිය පාරේ හිටියා. මම එතුමියට ගෞරවයක් හැටියට බැහැලා කථා කරලා මම යන්න ගියා. යනකොට එතුමිය මට කියනවා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දැදිගම ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. බලන්න මේ පාර අවුරුදු 10 කින්, 15 කින් හදලා නෑ. මමත් හිටපු මහ දිසාපතිතුමියක්. මට බොහොම කණගාටුයි ඔබතුමාට මේවා කියන්න සිද්ධ වෙන එක ගැන කියලා මට දිසාපතිතුමිය කිව්වා. ඇත්තටම මම මහජන නියෝජිතයෙක් හැටියට, දැදිගම ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට එතුමිය කළ ප්‍රකාශය පිළිබඳව මට බොහොම කණගාටුදායක සිදුවීමක් මට සිදුවුනා. ඇයි ගරු සභාපතිතුමනි, ලංකාවේ පළවෙනි අගමැතිනිය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය පත්වෙනකොට ලංකාවේ කාන්තාවක් හැටියට පළවෙනි මහ දිසාපතිතුමිය හැටියට පත් වුනේ ගුණතිලක මැතිණිය. එතුමිය එවැනි ප්‍රකාශයක් කරන කොට අපි පුංචි මහජන නියෝජිතයෝ හැටියට අපි දැදිගම ජනතාවක් හැටියට, දැදිගම නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මට ලොකු අපහසුතාවයක් සිදුවුනා ගරු සභාපතිතුමනි. මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි, ප්‍රධාන ඇමතිතුමාත්, මහා මාර්ග අමාත්‍යතුමාත් මේ ගැන විශේෂ

අවධානය යොමු කරලා අල්ගම, කන්දෙගම මාර්ගය හදලා දෙන්න කියන යෝජනාව කරමින් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ප්‍රධාන ඇමතිතුමාටත් සිහිපත් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! සිරිල් පල්ලෙපොල මන්ත්‍රීතුමාට. මීළඟට සිරිපාල කිරිඇල්ල විපක්ෂ සංවිධායකතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම කථා කරන්න ගත්ත එක මම සභාව කල් තබන වෙලාවට ගන්න අදහස් කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

**ශෝක ප්‍රකාශ යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත**

**පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

සමූපකාර අරමුදල සඳහා සකස් කළ රීති මාලාව ඉදිරිපත් කිරීම සඳහා දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*

-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි, සමූපකාර අරමුදල සඳහා සකස් කළ රීති මාලාව මම මේ අවස්ථාවේ දී සභාගත කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද සමූපකාර අරමුදල සඳහා වන

රීති මාලාව ප්‍රඥප්ති කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**පළාත් සභාවේ පොදු කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

සබරගමුව පළාතේ පළාත් සභාවේ මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය පිළිබඳව සාකච්ඡා කිරීම සහ අනුමැතිය ලබා ගැනීම.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
------------------------------------------------

ගරු සභාපතිතුමනි, මම මේ අවස්ථාවේ දී එම රීති මාලාව සභාගත කරනවා, ප්‍රඥප්ති කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම සඳහා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලස මහජන සෞඛ්‍ය පීඩා වැලැක්වීමේ ප්‍රඥප්තිය පිළිබඳව යෝජනාව එතුමා විසින් සභාගත කිරීමෙන් අනතුරුව ප්‍රඥප්ති කාරක සභාව වෙත යොමු කිරීම සඳහා එතුමා ඉල්ලා සිටිනවා. ඒ අනුව ප්‍රඥප්ති කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

**පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු :**

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/05 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා එතුමාට අවස්ථාව ලබාදෙනවා.

*ගරු මන්ත්‍රී රංජිත් පොල්ගම්පොල*
*கௌரவ உறுப்பினர் ரஞ்சித் பொல்கம்பொல*
*Hon.Member Ranjith Pollgampola*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාවේ සංශෝධනයක් කරන්න අවසර ඉල්ලනවා. ඒ නිසා වෙනත් දිනයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි ! ගරු රංජිත් පොල්ගම්පල මැතිතුමනි. කඩිනමින් එය සභා ලේකම් කාර්යාලය වෙත ලබාදීමට කටයුතු කරන

ලෙස ඉල්ලා සිටිනවා. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවේ සංශෝධන සහිතව ඉදිරිපත් කිරීම සඳහා ඉදිරි වාරයක දී කිරීම සඳහා අවශ්‍ය කටයුතු සළසා දෙනවා.

මීළඟට ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/06 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා එතුමාට අවස්ථාව. එතුමා සභාවේ නෑ.

ඒ අනුව මීළඟට ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/07 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා එතුමාට අපි අවස්ථාව ලබාදෙනවා. එතුමා සභාවේ නෑ.

මීළඟට ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 6/1/2017/08 දරණ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ඔබතුමාට අපි අවස්ථාව ලබාදෙනවා.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*

---

ගරු සභාපතිතුමනි, මාධ්‍ය අධ්‍යයනය සහ ජන සන්නිවේදනය නැමති විෂයය බොහෝ පළාත්වල හැදෑරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 2010 වසරේ සිට අනුමත කර ඇති අතර, සබරගමුව පළාතේ ද මෙයට අදාළ ගැසට් නිවේදනය මේ වනවිට නිකුත් කර ඇත.

මෙම නව විෂයය අ.පො.ස. සාමාන්‍ය පෙළ හදාරන දරුවන්ගේ සිට උසස් පෙළ දක්වා දරුවන්ට හැදෑරීමේ හිමිකම ඇත. නවීන ලෝකය සමඟ බලනවිට මාධ්‍ය අධ්‍යයනය හා ජන සන්නිවේදනය යන විෂයය වර්තමාන තරුණ පරපුරට අතිශය වැදගත්ය. ඔවුන් එම විෂයය හැදෑරීමට ද දැඩි කැමැත්තක් දක්වයි.

මෙම නව විෂයය මේ වනවිට ර/ඇඹි/බලවින්න, ර/නිවි/ගාමිණී යන මධ්‍ය මහා විද්‍යාලවල හා ර/නිවි/නාවලකන්ද මහා විද්‍යාලයේ ක්‍රියාත්මක වන බව දැන ගන්නට ඇත. නමුත් මාධ්‍ය අධ්‍යයනය උපාධිධාරීන් බඳවා නොගෙන ඇති නිසා මෙම විෂයය උගන්වනුයේ වෙනත් විෂයයන් සඳහා පත්වීම් ලද උපාධිධාරීන්ය.

දැනට මෙම උපාධිය ලබාගත් පනහකට ආසන්න පිරිසක් සබරගමුවේ ඇත. එබැවින් සබරගමුව පළාතේ ද ඉහත තරඟ විභාගයේ අංක 01 උප ලේඛණයේ සඳහන් විෂයයන්ට අමතරව මාධ්‍ය අධ්‍යයනය සහ ජන සන්නිවේදනය විෂයය ද ඇතුළත් කර අප පළාතේ දරුවන්ට ද එම අවස්ථාව ලබාදීම සුදුසු බව මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව ගත්තාම තරුණ තරුණියන් විශාල පිරිසක් අපේ බදාදා කාර්යාලයට ඇවිල්ලා මේක අත්‍යාවශ්‍ය බව හඳුන්වලා දුන්නා. ඒ අනුව තමයි ගරු සභාවට යෝජනාවක් වශයෙන් මෙම යෝජනාව ගෙනාවේ. මෙම යෝජනාව ගරු ප්‍රධාන ඇමතිතුමාත් ඉතාම වැදගත් කියන එක කිව්වා. ඒ නිසා මම මෙම යෝජනාව ඉදිරිපත් කරනවා.

අවස්ථාව ලබාදීම සම්බන්ධව මගේ ස්තුතියි පුද කරනවා ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තුතියි ! ගරු විපක්ෂයේ සංවිධායකතුමනි. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වීම සඳහා ගරු සලිත කරුණාරත්න මැතිතුමා. එතුමා සභාවේ නෑ. මීළඟට ගරු අධ්‍යාපන අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න අපේ කථික ලැයිස්තුවක් දීලා තියනවා. ඒ අයට අවස්ථාව ලබාදීලා ඇමතිතුමාට අවස්ථාව දෙන්න ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

හොඳයි. එහෙම නම් ගරු අජිත් කුමාර මැද්දේගම මැතිතුමා.

*ගරු මන්ත්‍රී අජිත් කුමාර*
*கௌரவ உறுப்பினர் அஜித் குமார*
*Hon.Member Ajith Kumara*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි, අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. ඇත්ත වශයෙන්ම එතුමා බලවින්න විද්‍යාලය ඇතුළු පාසල් කීපයක් නම් කරලා තියනවා මේ විෂයය ධාරාව උගන්වනවා, නමුත් සුදුසුකම් ලත් ගුරුවරු නෙමෙයි කියන එක. ඒ වගේම අද විශ්ව විද්‍යාල අධ්‍යාපනය හමාර කරලා උපාධිය ගත්තු සියයකට කිට්ටු පිරිසක් ඉන්නවා මාධ්‍ය පිළිබඳ උපාධිය ගත්තු අය. නමුත් ඒ අයට පත්වීම් ලබාදීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ විෂයයට සම්බන්ධ පත්වීම් ලබාදෙන්න අවශ්‍ය කටයුතු කරලා නෑ. අපේ සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ මේ පළාත් සභාවේ යෝජනා කරලා, ඒ යෝජනාව මධ්‍යම ආණ්ඩුවට දැනුම් දීලා මධ්‍යම ආණ්ඩුව හරහා මේ උපාධිධාරීන් බඳවාගෙන ඒ විෂයය උගන්වන්න එම පාසැල්වලට පත්වීම් ලබාදෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා. දැන් සාමාන්‍ය පෙළ ඉගන ගන්න ළමයෙක් ඉන්නවා නම් ඒ ශිෂ්‍යයන්ට අවශ්‍ය නම් මාධ්‍යය පිළිබඳ විෂයයක් හැටියට හදාරන්න, ජන සන්නිවේදනය පිළිබඳ විෂයයක් හැටියට හදාරන්න ඒ විෂයය හදාරන්න ඒ ළමයින්ට අවස්ථාව දෙන්න ඕන. ඒක තමයි විදුහල්පතිතුමාගේ වගකීම වෙන්නේ. හැබැයි මෙතුමා මතක් කළා වගේ ඒකට සුදුසුකම් ලත් උපාධිධාරියෙකු සමහරවිට ඒ පාසලේ නොසිටින්න පුළුවන්. හැබැයි අර ළමයාගේ ඉල්ලීම නිසා වෙනත් විෂයයකට උපාධිය ලබපු ගුරුවරයෙක්ව මේ විෂයය ඉගැන්වීම සඳහා යොදවන්න පුළුවන්. එහෙම තමයි දැන් මේ දවස්වල සිද්ධ වෙන්නේ. හැබැයි විශේෂිත උපාධියක් හිමි

තරුණ අය අද පත්වීමක් නොලබා එළියේ සිටිනවා. ඒ අයට ඒ අවස්ථාව ලබාදෙන්න පුළුවන් නම් අර ශිෂ්‍යය පරම්පරාවට හොඳ අධ්‍යාපනයක් ලබන්න පුළුවන් අවකාශය, අවස්ථාව ලැබෙනවා. ඒක නිසා එතුමාගේ යෝජනාව අපි ස්ථිර කරනවා, ඉතාම සුදුසු යෝජනාවක් හැටියට. ඒ වගේම අපි මේ පළාත් සභාවේ යෝජනා කරලා, ඒක මධ්‍යම ආණ්ඩුවට දැනුම් දීලා මධ්‍යම ආණ්ඩුව හරහා අනුමැතියකින් අපේ පළාත් සභාව තුළ ඒ විෂයය ඉගැන්වීම සඳහා ජන සන්නිවේදන හා මාධ්‍යය විෂයය ඉගැන්වීම සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම සුදුසුයි කියන යෝජනාව මම මතක් කරනවා. බොහොම ස්තුතියි !

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි ! අජිත් කුමාර මැද්දේගම මන්ත්‍රීතුමනි. මීළඟට යෙහියා ඉෆ්ලාර් මන්ත්‍රීතුමා.

***ගරු මන්ත්‍රී එම්.වයි.එම්.ඉෆ්ලාර්***
***கௌரவ உறுப்பினர் எம்.வை.எம்.இப்லார்***
*Hon.Member M.Y.M.Iflar*
---------------------------------------------

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද අධ්‍යාපනය සම්බන්ධයෙන් පාසැල්වල ජන සන්නිවේදන විෂයය මාලාව සම්බන්ධයෙන් මේ වනවිට අපි දැකපු දෙයක් තමයි පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය විසිනුත් අපේ ප්‍රධාන ඇමතිතුමා ජන සන්නිවේදනය සම්බන්ධයෙන් අධ්‍යයනය ලබපු දරුවන්ට මැතක දී උත්සවාකාරයෙන් ඒ අයට පුහුණුව ලබාදීලා අවසාන කරලා ඒ සඳහා විශේෂ පහසුකම් සළසා දීලා ඒ අය දැනුවත් කිරීමකුත් සිදුකළා. ඒ වගේම අපි බලාපොරොත්තු වෙන්නේ පාසල තුළත් ඒ සඳහා උනන්දුවක් දක්වන, ඒ සඳහා කැප වෙන, ඒ සඳහා දරුවන්ගේ අධ්‍යාපනය මෙහෙයවන්න පුළුවන් ජන සන්නිවේදන පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය කරන ගුරුභවතුන් බඳවා ගැනීම සඳහා තමයි එතුමා මේ වෙනකොට කථා කරන්නේ. ගරු සභාපතිතුමනි, ඉතාමත්ම වැදගත්. මේ විෂයය පාසැල තුළ පවතින්නේ නම් ඒ සඳහා විශේෂිත උපාධියක් ලබාගත්ත උපාධිධාරීන් අප පළාත තුළ සිටින්නේ නම් එතුමාගේ ඉල්ලීම අපි වැදගත්කොට සළකලා පාසැල තුළ ජන සන්නිවේදන අධ්‍යාපනය ලබන දූවා දරුවන්ට මේ පහසුකම සළසා දීම ඉතාම වැදගත්. අපේ අජිත් කුමාර මැද්දෙගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයටම මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ මේ සඳහා යමක් කරන්න පුළුවන් නම් ඒ සඳහා මැදිහත්වීමක් කරලා කටයුතු කරන ලෙසත්, එසේත් නැත්නම් ඒ සඳහා රේඛීය අමාත්‍යාංශය තුළ මේ සඳහා අනුමැතියක් ලබාගත යුතු නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ වැඩ සටහන යටතේ මේ පිළිබඳන ඔබතුමාගේ අවධානය යොමු වෙනවා නම් ඒක වැදගත් බව මට තේරෙනවා.

ගරු සභාපතිතුමනි, මම එහෙම කියන්න හේතුව අද උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් සිටිනවා, ඔවුන්ට රැකියා නැතුව අද විවිධ අපහසුතාවයට ලක්වෙලා. නමුත් අපි මෙවැනි පුරප්පාඩු තිබිලා එවැනි අධ්‍යාපනය ලබන්න පුළුවන් දරුවන්ට

ලබාදෙන්න පුළුවන් පහසුකම් තිබිලා ඒ පුරප්පාඩු පිරවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේ නැත්නම් ඒ තුළත් අපි දකිනවා අඩුපාඩුවක් යම්කිසි සැළැස්මක. නමුත් අපි සෑම දරුවෙකුටම හොඳ අධ්‍යාපනයක් ලබාදීම වැදගත් වගේම සෑම දරුවෙකුටම තමන්ට යාහැකි මාර්ගය තුළ යාම සඳහා අවකාශ ලබාදීම වැදගත්. එවැනි අවස්ථාවක වෙනත් විෂයයන් උගන්වන ගුරුවරුන්ට වඩා ඒ සම්බන්ධයෙන් ප්‍රවීනත්වය තියන, ඒ සම්බන්ධයෙන් හැකියාව තිබෙන, ඒ සම්බන්ධයෙන් උපාධියක් තිබෙන ගුරුවරු ලවා මේ අධ්‍යාපනය ලබාදීම වැදගත්. ඒ වගේම ඒ තුළ විශාල ගුණාත්මකභාවයක් අපි දකිනවා. ඒ වගේම සිරිපාල කිරිඇල්ල මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව ස්ථිර කරමින් මේ සම්බන්ධයෙන් අපේ විෂයය භාර ගරු අමාත්‍ය භානු මුණිප්‍රිය ඇමතිතුමා මේ ගැන අවධානය යොමු කරලා නුදුරු අනාගතයේ දී මේ සබරගමුවේ මේ දැවෙන ප්‍රශ්නයට පිළිතුරක් වශයෙනුත්, ඒ වගේම බලාපොරොත්තුවෙන් සිටින උපාධිධාරී ජන සන්නිවේදන විෂයය හදාරපු අයටත් සහනයක් සළසන්න කටයුතු කරනවා නම් ඉතා අගයකොට සළකන බව ප්‍රකාශකර සිටිමින් තමුන්නාන්සේ මට අවස්ථාව සළසා දීම පිළිබඳ ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. ස්තුතියි !

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
----------------------------------------------------------

ස්තුතියි ගරු යෙහෙයියා එම්. ඉෆ්ලාර් මන්ත්‍රීතුමනි. මීළඟට පිළිතුරු කතාව කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍ය ගරු භානු මුණිප්‍රිය ඇමතිතුමාට අවස්ථාව ලබා දෙනවා.

*ගරු අමාත්‍ය භානු මුනිප්‍රිය*
*கௌரவ அமைச்சர் பானு முனிப்பிரிய* *Hon. Minister Bhanu Munipriya* -----------
-------------------------------------------------

ගරු සභාපතිතුමනි මේ කාරණය සම්බන්ධයෙන් කෙටි උත්තරයක් තියෙන්නේ. එකක් තමයි අද වනවිටත් මාධ්‍ය අධ්‍යයනය හා ජනසන්නිවේදනය කියන විෂය අ.පො.ස. උසස් පෙළ සඳහා අපේ පළාත් සභාව තුළ තිබෙන පාසැල්වල අධ්‍යාපනය ලබන සිසුන්ට ඇති වෙන්න ගුරුවරු ඉන්නවා. ඒවගේම ඒකේ කිසි අඩුපාඩුවක් නෑ. ඒ නිසා කැමති අයට මේ විෂය ඉගෙන ගන්න අවස්ථාවක් නොලැබෙනවා කියන එක පිළිගන්නේ නෑ. ඒක එකක්. අනිත් එක අද වෙන කොට කලා උපාධිධාරීන්ගේ ප්‍රමාණය මේ සියළු දෙනා කලා උපාධිධාරීන් අපිට අවශ්‍ය 8000 නම් කලා උපාධිධාරීන් 9000 ක් වැනි අතිරික්තයක් පළාත් සභාවේ ගුරු සේවය තුළ දකින්න පුළුවන්. එම නිසා අපි ඉල්ලපු සෞන්දර්යේ අධ්‍යාපනයේ නැටුම්,සංගීත විෂයන්වත් මෙවර අපි අයදුම් පත්‍ර කැඳවූයේ නෑ. එකක් තමයි මේ මාධ්‍ය අධ්‍යයනය සහ ජනසන්නිවේදනය කියන එකත්. නමුත් අපි තව මාස තුනක් ඇතුළත මේ අය අනුයුක්ත කර ගත්තාට පස්සේ අලුත් පත්වීම් දුන්නාට පස්සේ විශ්‍රාම ගිය අය විවාහ වුණාට පස්සේ පළාතෙන් ඉවත් වී ගිය අය ඒවගේම මිය ගිය අය ගණන් අරගෙන සලකලා ඒ විෂයන් වලට අනුව නැවත අපි දැන්වීම් කරන්න ඉන්නවා උපාධිධාරීගෙන් මේ විවිධ විෂයන්. ඒ කියන්නේ ගණිතය ,විද්‍යාව, ඉංග්‍රීසි,කෘෂිකර්මය,තොරතුරු තාක්ෂණය, නැටුම්, සංගීත මෙවර දැන්වීම් නොකරපු ඒ විෂයන් වලදී මේ දරුවන්ට අවස්ථාවක් ලැබෙයි කියන විශ්වාසය තිබෙනවා . හැබැයි හැම දරුවෙකුටම රැකියා දෙන්න බැරි වුණත් උපාධිධාරී දරුවන්ට රැකියා

දෙන එක අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීමක් නෙමෙයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ තියෙන අදාල විෂයන් වලට අනුව පුරප්පාඩු දැරීම පමණයි. දැන් පනස් දෙනෙක් ඉන්නවා නම් ඒ විෂයට ඒකෙන් හතර දෙනෙකුට ගුරු වෘත්තිය ලැබෙයි. හැබැයි අනිත් 47 දෙනාටම රැකියා ලබාදීම රජයේ වගකීමක්. ඒ සඳහා වෙන වැඩ පිළිවෙලක් ගත යුතු බව මම ඉතා ගෞරවයෙන් සඳහන් කළ යුතුයි. බොහොම ස්තුතියි.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ස්තුතියි ගරු අධ්‍යාපන ඇමතිතුමා භාණු මුණිප්‍රිය ඇමතිතුමාට. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙකුත් ඒවගේම ගරු අධ්‍යාපන ඇමතිතුමා විසිනුත් ප්‍රතිඋත්තර ලබාදීමට කටයුතු කෙරුවා. ඒ සඳහා ඒ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා අදාල ආයතන වෙත ඒ යෝජනාව ඉදිරිපත් කරමින් අවශ්‍ය සම්බන්ධීකරණය ලබාදීම සඳහා කටයුතු කරන බව ඔබතුමන්ලාට දැනුම් දෙනවා.

***ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ***
***கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க***
*Hon.Member Ramya Kumara Weerasinghe*

---

ගරු සභාපතිතුමනි මම ඉතාම අත්‍යාවශ්‍ය වූ සෞඛ්‍ය කාරණාවක් සඳහා නිසා තමයි මෙතන හිටියේ නැත්තේ. මගේ යෝජනා දෙක කියවිලා තිබුණා. මෙම ගරු සභාවේ තවම පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා අවසන් වී නැති හින්දා ඉතාම වැදගත් යෝජනා දෙකක් වන මෙම යෝජනාදෙක ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*

---

ගරු රම්‍යකුමාර මන්ත්‍රීතුමා සභාව ආරම්භ කිරීමෙන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව 16 වෙනි අංකය සඳහා තමයි අපි දැන් ගමන් කරන්නේ. සභාව කල් තැබීමේ යෝජනාව. එතකොට සභාවේ ක්‍රමවේදය අනුව මෙතෙක් පැවතිච්චි ක්‍රමවේදය අනුව සභාවේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ හිටියේ නැත්නම් පසුව ඒකට ලබාදීමට අවස්ථාවක් නෑ. මම කණගාටු වෙනවා. ඒක අපි ඊළඟ දිනයේදී අවස්ථාව ලබාදීම සඳහා කටයුතු කරනවා. මීළඟට සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු අසෝක ජයවර්ධන මැතිතුමාට ආරාධනා කරනවා.

***ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා.***
***கௌரவ அ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன***
*Hon.Gov.Whip Asoka Jayawardane*

---

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017 අප්‍රේල් මස 04 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබන ලෙස මම යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතිය ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමාට. මීළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල ගරු මැතිතුමාට අවස්ථාව.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ ප්‍රශ්නය ඉතාම වැදගත්ත ප්‍රශ්නයක්. රත්නපුර විවිධ සේවා සමුපකාර සමිතියේ එක්කෝටි හතළිස් දෙලක්ෂ ගාණක වංචාවක් සම්බන්ධව මම මේ ගරු සභාවට ඉදිරිපත් කළා දැනට අවුරුද්දයි මාසයකට කලින්. මෙතෙක් මේ ගැන ගත් ක්‍රියාමාර්ගයක් හා වුණ සිද්ධියක් සම්බන්ධව දන්නේ නෑ. නැවත චැනල් සෙන්ටර් එක අරින්නට ලක්ෂ පහකට ලැස්ති වෙලා තිබුණත් මේක ලක්ෂ දෙක හමාරකට කරන්නට කටයුතු කරලා තියෙනවා. මේකේ ලිපියේ සම්පූර්ණ විස්තර තියෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමාට දෙනවා. මෙතන ප්‍රධාන ඇමතිතුමාත් අපහසුතාවයට පත් වෙලා තිබෙන බව මට දැනෙනවා. මේක රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන ඇමතිවරයෙක්ගේ වැඩක් කියන එක මම නම් ගම් කියන්නේ නෑ. ඒක හොයා ගන්න ඔබතුමාලා.

*ගරු මන්ත්‍රී ප්‍රභාත් මහේෂ් ද අල්විස්*
*கௌரவ உறுப்பினர் பிரபாத் மஹேஷ த அல்விஸ்* *Hon.Member Prabath Mahesha de Alwis*
----------------------------------------------------

නම් ගම් කියන්න. ඇයි බොරු කියන්නේ. (ඝෝෂාව)

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
----------------------------------------------------------

ලක්ෂ දෙක හමාරකට දෙන්න හදනවා කියන එක නම් ගම් කියන්නේ නෑ. මේක ඇමතිවරයෙක්ගේ බලපෑමක් තියෙනවා කියලා ආරංචියි. ගරු සභාපතිතුමනි. මෙතන ගරු ඇමතිවරයෙක්ගේ බලපෑමක් උඩ ලක්ෂ පහට යන්න ගිය එක ගරු සභාපතිතුමනි මේ චැනල් සෙන්ටර් එක ඔබතුමා දන්නවා දැන් අවුරුදු තුනක් වහලා. කෝටි දහයකට වැඩිය පාඩුයි. මේවා විවිධ සේවා සමුපකාරයට එන මුදල් මේ ගසා කෑම මේ වලක්වලා මේක ඇමතිවරයෙක්ගේ බලපෑමක් ඇති කරලා ලක්ෂ දෙක හමාරකට දෙන්නට යනවා කියලා ආරංචියක් තියෙනවා ගරු සභාපතිතුමනි. සමුපකාරය ගැන මම මේ සභාවට ආපු දා ඉඳලා කතා කරනවා ගරු සභාපතිතුමනි සමුපකාරය ගැන. ඒ ඇයි. සමූපාකාරය කියන්නේ දුප්පත් මනුස්සයාගේ කඩේ. ඒක තමයි ඒ මනුස්සයාට පිහිට වෙන එකම දේ. අපි මේක අමුතුවෙන් කියන්නට අවශ්‍ය නෑ ගරු සභාපතිතුමනි 70 දසකයේ තමුන්නාන්සේත් හිටියා. ඉන්න ඇති. තමුන්නාන්සේට මතක ඇති එදා පෝළිම් යුගයේ එදා මේ අසරණ ජනතාවට පිහිට වුණු එකම දේ සමූපකාර සමිතිය. මේ

සමූපාකාර සමිතිය හරහා ගත්තහම ගරු සභාපතිතුමනි කෝටි ගාණක් ගසා ගෙන කාලා ලක් වෙලා තියෙනවා. ඒ අතරට ඇමතිවරයෙක් මූලිකත්වය දරලා ලක්ෂ පහ දෙක හමාරට බස්සලා දෙන්න යනවා නම් අපිට මේක කරන්න බැරි වෙනවා ගරු ප්‍රධාන ඇමතිතුමාත් අසරණ වෙනවා මෙතන. ඒ නිසා ඒ කරුණු කාරණා ඕන තැනකින් හොයා ගන්න සී.අයි.ඩී. එකට දෙන්න විවිධ තැන් වලින් දැන ගන්න. අපි ප්‍රධාන ඇමතිතුමාට කියන්නේ තමුන්නාන්සේ මේ සානුකම්පිතව කරන සේවය ගැන නැවතත් තමුන්නාන්සේ අධ්‍යයනය කරලා මේ ලක්ෂ පහට දෙන්න යන දේ දෙක හමාරට නොදී ඒ සමූපකාරය ආදායමක් වෙන ආකාරය ඒ කටයුත්ත කරන්න කියන ඉල්ලීම කරනවා. මේ ගරු ප්‍රධාන ඇමතිතුමාට මේ ලිපිය භාර දෙනවා. ස්තූතියි ගරු සභාපතිතුමනි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*

-----------------------------------------------------------

ගරු ප්‍රධාන ඇමතිතුමා

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත්*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*

------------------------------------------

ගරු සභාපතිතුමා මෙම කාරණාවේදී මේකේ සත්‍යතාවය අපේ ගරු මන්ත්‍රීතුමාට මේ කරුණු පැහැදිලි කරලා දුන්නා කවුරු හරි මේකේ ඇත්ත කියලා නෑ. මේක ඇත්තටම වැහිලා ගිහිල්ලා තිබිලා නැවත වරක් විශේෂයෙන්ම රත්නපුර මැතිවරණ කොට්ඨාශයේ දේශපාලන අධිකාරිය මැදිහත් වුණා මේක ආරම්භ කරන්න මේක දූප්පත් මිනිස්සුන්ට තිබුණ තැන. එක්කෙනෙක් ජෝන් සෙනෙවිරත්න ඇමතිතුමා. අපේ ගරු රංජිත් බණ්ඩාර ඇමතිතුමාලා. මේ ඔක්කෝම මේක ආරම්භ කරන්න කියලා සමූපකාර සභාපතිතුමාත් මම ගෙනල්ලා කොමසාරිස්තුමාත් එක්ක සාකච්ඡා කරලා අපි මේ කාරණාව සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමක් තුළින් තමයි ඔය ටෙන්ඩර් පත් දෙකයි ලැබිලා තියෙන්නේ. එකක් එක්ලක්ෂ හැත්තෑ පන්දාහකට . අනිත් එක දෙලක්ෂ පනස්දාහකට. දැන් ටෙන්ඩර් කැඳවීමක් කළහම ගරු සභාපතිතුමනි එහි තිබෙන වැඩිම ලංසුවට තමයි මේක අපි දීලා තියෙන්නේ. ඒක කොමසාරිස්තුමාලාටත් ඇවිල්ලා ඒ අය බලලා මේක අපි නිකන්ම තිබුණ එකක් මේ දෙලක්ෂ පනස්දාහවත් හම්බ වෙන්නේ නෑ මේකට දුන්නේ නැත්නම්. ඉතිං මේ ආයතනය ලාභදායීව ගෙනිහිල්ලා තියෙන්නේ මෙතෙක් කාලයක් ඇත්තෙන්ම මේ වෛද්‍ය සේවය නිසා. ඉතිං මේකට මම ස්තූතිවන්ත වෙනවා මාව ධෛර්යමත් කළා දේශපාලඥයෝ කීප දෙනෙක් කතා කරලා ඇයි මේ දුප්පත් අයට තිබුණ එක විවෘත කරන්න කියලා. එහෙම එකක් කළා මිසක් මෙම ටෙන්ඩර් ක්‍රමය යටතේ මේවාට කිසිම කෙනෙක්ගේ ඇඟිලි ගැසීමක් නෑ. මේකේ අනුමැතිය දීලා තියෙන්නේත් දෙපාර්තමේන්තු. අපි නෙමෙයි. අපි මේ කාර්යය සඳහා සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය ධෛර්යමත් කරලා නිළධාරීන්ට කියලා මේක නොතිබ්බ්වි ආදායමක් අරන් දීලා තියෙනවා. දැන් මේ කවුරු හරි ගන්න බැරි වෙච්චි කෙනෙක් ගිහිල්ලා මේක අඩු ගාණට ගිහිල්ලා කොටසක් මං හම්බ වෙන්නත් ආවා. මම කිව්වා මට අඩු ගාණට දෙන්නට බෑ. මේකේ වැඩිම මුදලට තමයි දෙන්න

පුළුවන් කියලා දුන්නා. ඒක තමයි වෙලා තියෙන්නේ.

ඒ නිසා සිරිපාල කිරිඇල්ල ගරු මන්ත්‍රීතුමනි කවුරුවත් දේශපාලඥයින්ට චෝදනා කරන්න එපා. මේක පිළිගන්නේ නෑ. මේ කාරණාවේ මුල ඉඳලම මේ විෂයපතයේ මම හිටියා. එහෙම නම් අපිට හිතවත් කෙනෙකුට දෙන්න කියලා අපිට එහෙම එකක් නෑ. මේ විවෘත ටෙන්ඩර් ඉදිරිපත් කළහම දෙකයි ටෙන්ඩර් පත් ආවේ. ඒ දෙකෙන් වැඩිම ලංසුවට තමයි දීලා තියෙන්නේ. ඒක නිසා මම කණගාටු වෙනවා එතුමා කවදාකවත් එහෙම දේශපාලඥයන්ට එහෙම අගෞරව කරන කෙනෙක් නෙමෙයි. එතුමාට කවුරු හරි වැරදි තොරතුරක් දීලා ඇති. මේකේ ඇත්ත සත්‍ය තත්ත්වය මම ගරු සභාපතිතුමනි මා ගරු සභාවට දැන්විය යුතුයි. කාගේ හරි ඒ සම්බන්ධයෙන් හිත් අමනාපකම් ඇති වුණා නම් අපි ඒවා නැති කරන්නට ඕනේ. අපි මේකේ සත්‍ය තත්ත්වය මම මේක පැහැදිලිවම මම ඕන වගකීමක් භාර ගන්නවා. ඒකේ වැරදි දෙයක් සිද්ධ වෙලා නෑ.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තූතියි ගරු ප්‍රධාන අමාත්‍යතුමනි.

*ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල*
*கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல*
*Hon.Opposition Whip Siripala Kiriella*
-----------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ තව යෝජනාවක් තියෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමනි තමුන්නාන්සේ අපහසුතාවයට පත් කරන්න නෙමෙයි. මේ එක්කෝටි හතළිස් දෙලක්ෂයක වංචාවක් වෙච්ච් තැනක්. ඒ නිසා තමයි මේ ගිනි පෙනෙල්ලෙන් බැඩ කාපු කෙනා කලාමැදිරි එළියටත් බයයි. අන්න ඒ කාරණා නිසා තමයි ගරු සභාපතිතුමනි මම මේ සභාවට කිව්වේ.

ඒවගේම අත්‍යාවශ්‍ය දෙයක් ගරු සභාපතිතුමනි කිරිපෝරුව රෝහල කිරිපෝරුව රෝහලට ගරු සභාපතිතුමනි වෛද්‍යවරයෙක් ලබාදීම සම්බන්ධව ගරු ප්‍රධාන ඇමතිතුමාට පළමුවෙන්ම මගේ ගෞරවනීය ස්තූතිය පිරි නමනවා. දැනට හිටපු වෛද්‍යවරයා ජනතාව අකමැතියි කියපු වෛද්‍යවරයා දැන් පළවෙනිදා යනවා. මෙතන ගරු සභාපතිතුමනි පැය විසි හතරට වෛද්‍යවරු තුන් දෙනෙක්වත් ඉන්න ඕනේ කියලා මතය දරනවා. මම උදේ දවස් තුනක් ගියා ගරු සභාපතිතුමනි මෙතන 500 කට වැඩි පිරිසක් මෙතන නේවාසිකව දිනපතා මෙතන බාහිර රෝගීන් ඉන්න බව සඳහන් වුණා. ඒ අනුව ගරු සභාපතිතුමනි දැන් වාට්ටුවල නවතින්නේ නැත්තේ ලෙඩ්ඩු මෙතන පහසුකම් යම් යම් දේවල් තියෙනවා. මම මේ අඩුපාඩුකම් සියල්ල සඳහන් කරලා තියෙනවා. මෙතන මම නෙමෙයි රෝහල් කමිටුව තමයි මෙතන සටහන් කරලා තියෙන්නේ. ඒ ටික සපුරලා මේ රෝහලේ නැවත පහළොස් දාහකට වැඩි පිරිසක් ගත්තහම ගරු සභාපතිතුමනි දම්මුල්ල දිහාවේ ඉඳලා

එනවා ,වැල්කනියායේ ඉඳලා එනවා. එතනින් ගියහම මිටිපොල කිරිපෝරුවේ ඉඳලා එනවා . ඉද්දමල්ගොඩ පැත්තෙන් එනවා. මේ පැත්තෙන් ඇරැපොළ ගත්තහම ,නැඳුරන ගත්තහම ,හිඳුරන්ගල ගත්තහම මේ පැත්තේ මේ ප්‍රදේශයේ වැඩි දෙනෙක් කිරිපෝරුව රෝහලෙන් බෙහෙත් ගන්නේ. ඉතිං මේ රෝහලේ අඩුම තරමේ අත්‍යාවශ්‍යම වෛද්‍යවරු තුන් දෙනෙක් ඉන්න ඕනේ. දැන් වෛද්‍යවරු දෙන්නෙක් ඉන්නවා. තව එක වෛද්‍යවරයෙක් මේකට වුවමනා කරනවා. හෙදියෝ ඇත්තේම නෑ. මේ රෝහලට හෙදියෝ තුන් දෙනෙක්වත් ඕනේ ගරු සභාපතිතුමනි. සනීපාරක්ෂකයෝ. මේකේ විස්තර ඔක්කෝම තියෙනවා. ගරු ප්‍රධාන ඇමතිතුමාට මේ සියල්ලම දෙනවා. මේක ඉතාම වැදගත් දෙයක්. ජනතාව හැමදාම කියනවා කිරිපෝරුව රෝහල ගැන. තමුන්නාන්සේ දන්නවා යනවා. තමුන්නාන්සේ දකින කොට මේ රෝහල කොච්චර වැදගත්ද කියලා කියනවා.

මේ නිසා රියදුරුගේ ක්වාටස් එක ගත්තහම තෙමෙනවා. මේ ඔක්කෝටම ගරු සභාපතිතුමනි ලොකු මුදලක් යන්නේ නෑ. ගස්වල කොළ රැදිලා එහෙම නැත්නම් උළු දාන ඒවා නොම්බර එක දෙක කලවම් වෙලා දාලා. නැත්නම් දෙක දාලා. මෙන්න මේවගේ සුළු දේවල් වලින් තමයි ගරු සභාපතිතුමනි තෙමෙන්න වෙලා තියෙන්නේ. දිරා පත් වෙන්න වෙලා තියෙන්නේ. මේ සියල්ල ගත්තහම ලක්ෂ තුනකවත් මුදලක් මේ යන්නේ නෑ. අපිට පළවෙනි දේ තමයි අත්‍යාවශ්‍යම දේ තමයි හෙදියෝ තුන් දෙනෙකුයි වෛද්‍යවරු දෙන්නෙකුයි අරගෙන මේ රෝහල පවත්වාගෙන යන්න සලස්වන්න කියලා මම ඉතා ගෞරවයෙන් ඉල්ලනවා ගරු සභාපතිතුමනි. ප්‍රධාන ඇමතිතුමාට මේ ලිපිය භාර දෙනවා.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාට. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සෞඛ්‍ය අමාත්‍ය ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා වෙත පිළිතුරු ලබාදීම සඳහා අපි ලබා දෙනවා. මීළඟට ගරු අකිල සාලිය එල්ලාවල මැතිතුමා.

***ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා.***
***கௌரவ உறுப்பினர் அகில எல்லாவல***
*Hon. Member Akila Ellawala*
-----------------------------------------------------------

ගරු සභාපතිතුමනි පළාත් උපමාන පාදක අරමුදල් යටතේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන ප්‍රතිපාදන වලදී සාමාන්‍යයෙන් ප්‍රජා ශාලා සඳහා 2016 වෙනකන් ප්‍රතිලාභ ලබාදීමට හැකියාව තිබුණා. නමුත් ගිය අවුරුද්දේ මේ අවුරුද්දේත් චක්‍ර ලේඛණවල තියෙනවා පළාත් උපමාන පාදක අරමුදල් වලින් ප්‍රතිසංස්කරණය කරන්නත් බෑ ප්‍රජා ශාලාවක් අලුතින් ඉදිකිරීමට ලබා දෙන්නත් බෑ. නමුත් අපිට භාගයට හදපු ප්‍රජා ශාලා තියෙනවා. දැන් ගිය අවුරුද්දේ කිව්වා මේ අවුරුද්දේ ඒ චක්‍ර ලේඛණය වෙනස් වෙයි කියලා. නමුත් මේ අවුරුද්දේත් ඒ චක්‍ර ලේඛණය ඒ විදිහටම ඇවිල්ලා තියෙනවා. ඒක නිසා දැන් භාගයකට හදපු ප්‍රජා ශාලා තියෙනවා. ඒ සඳහාවත් අපිට අවසරය ලබා දෙනවා නම් ඉතුරු ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන්න. ඒක ඉතාමත් ඵලදායී කියලා මම විශ්වාස කරනවා. එම යෝජනාව මම මේ

සභාවට ඉදිරිපත් කරනවා. මේ අවස්ථාව අපිට ලබා දෙන්න කියලා. ස්තූතියි.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු අකිල සාලිය එල්ලාවල මැතිතුමනි.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ යෝජනාව

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව අකිල සාලිය මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ප්‍රධාන අමාත්‍යාංශය වෙතත් ප්‍රධාන අමාත්‍යතුමා වෙතත් යැවීමට කටයුතු කරනවා. ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම සඳහා. රම්‍යකුමාර මන්ත්‍රීතුමා.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි මගේ යෝජනාව සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් විදිහට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

*ගරු සභාපති කංචන ජයරත්න*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன*
*Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

දැන් ඒකට ඉඩකඩ ලබාදීමට හැකියාවක් නෑ. ඒකට කලින් ඉදිරිපත් කරන්න ඕනේ. දැන් කල් ගිය අවස්ථාවක් නේ තියෙන්නේ ඒකට ඉඩකඩක් නෑ. අපිට රීතියක් අනුව ඉඩකඩක් හැකියාවක් නෑ ගරු මන්ත්‍රීතුමා ඒ කටයුත්ත කරන්න.

*ගරු මන්ත්‍රී රම්‍යකුමාර වීරසිංහ*
*கௌரவ உறுப்பினர் ரம்ய குமார வீரசிங்க*
*Hon.Member Ramya Kumara Weerasinghe*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි අපිට දැන් තියෙන යෝජනා ටිකත් එක්ක ලබන සභා වාරයට කල් ගිහිල්ලා තියෙන නිසා මම මේක බැලුවේ.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ලබන සභා වාරය ලබන සුමානයේ තියෙන්නේ. 04 වෙනිදාට සභාව තියෙන්නේ. කල් තිබ්බේ හතර වෙනිදාටනේ.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------------------

අත්‍යාවශ්‍ය එකක් ඉදිරිපත් කරන්න තමයි වෙලාව ගත්තේ. මම අර පෞද්ගලික හේතුත් මේකට දාලා තමයි තමුන්නාන්සේගෙන් වෙලාව ගත්තේ. මට විනාඩියක් ගරු සභාපතිතුමා

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ඉතාම කෙටියෙන් ඉවර කරන්න.

***ගරු විපක්ෂ සංවිධායක සිරිපාල කිරිඇල්ල***
***கௌரவ எதிர்க்கட்சி அமைப்பாளர் சிறிபால கிரிஎல்ல***
*Hon.Opposition Whip Siripala Kiriella*
---------------------------------------------------------------

ගරු සභාපතිතුමා පාන් කඩේ පැති බැම්ම ගත්තහම පාරත් එක්ක හරියටම දෙකෙන් පංගුවක් ගිලා බැහැලා. ගරු සභාපතිතුමනි කණුග්ගල්ලට යන පාර පාන් කඩේ ගාවින් මෙහා පැත්ත පතල් කැපීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම පාරෙන් දෙකෙන් පංගුවක්ම ගිලා බැහැලා ගරු සභාපතිතුමනි. මේක ඉතාම ඉක්මනින්ම ප්‍රතිසංස්කරණය නොකළොත් කෝටි දහයකට වැඩි මුදලක් රජයට වැය වෙනවා. මේ නිසා ඉතා ඉක්මනින්ම මේක ප්‍රතිසංස්කරණය කරන්න ඕනේ කියලා මතය දරන නිසා මම මේ ලිපිය සභාගත කරනවා ගරු සභාපතිතුමනි පාන් කඩේ ළඟ කණුග්ගල්ල පාර විනාශ වෙච්චි එක සම්බන්ධව. එහෙම නම් බොහොම ස්තූතියි ඔබතුමාට කාලය ලබාදීම පිළිබඳව.

***ගරු සභාපති කංචන ජයරත්න***
***கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன***
*Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------------

ස්තූතියි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සිරිපාල කිරිඇල්ල මැතිතුමාටත්. ඔබතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාවත් අදාල අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරනවා.

මම කණගාටු වෙනවා රම්‍යකුමාර වීරසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දෙක ඉදිරිපත් කරන අවස්ථාවේ එතුමා සභාවේ නොසිටී නිසා එතුමා විසින් කරන ලද ඉල්ලීමට සභාවේ තියෙන ඉඩකඩ අනුව රීති පරිපාටිය අනුව ඉඩකඩ ලබාදීමට නොහැකිවීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරනවා.

දැන් වේලාව පෙරවරු 11.10 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා. මෙම ගරු සභාව 2017 වූ අප්‍රේල් මස 04 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තබනවා .

අත්/කළේ :
කංචන ජයරත්න
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ මාර්තු මස 30 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.